**ශීර්ෂය 103 - ආරක්ෂක අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 103 - ආරක්ෂක අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 සැප්තැම්බර් 26 දින ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

## 2.1 විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 17,487.14 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 13,152.33 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 4,334.81 ක් හෙවත් සියයට 24.79 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 5,936.45 | 5,694.38 | 242.07 | 4.08 |
| මූලධන | 11,550.69 | 7,457.95 | 4,092.74 | 35.43 |
| **එකතුව** | **17,487.14** | **13,152.33** | **4,334.81** | **24.79** |

**2.2** ආදායම් ගිණුම

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

අමාත්‍යාංශය විසින් 2016 වර්ෂය සඳහා අංක 10.03.07.05 දරන ආදායම් සංකේතය සඳහා රු.මිලියන 12.75 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 13.73 ක ආදායම් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 7.69 කින් ඉක්මවා ආදායම් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| **ආදායම් සංකේතය** | **ඇස්තමේන්තුගත ආදායම** | **තථ්‍ය ආදායම** | **ඉක්මවීම** | **ඉක්මවීම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| 10.03.07.05 | 12.75 | 13.73 | 0.98 | 7.7 |

**2.3** රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 10301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** |
| 60.00 | 56.23 | 40.00 | 47.36 | 275.00 | 139.04 |

**2.4** පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 04 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 229.57 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු.මිලියන** |
| 6000/000/00/0002/0115/000 | 1.60 |
| 6000/000/00/0013/0072/000 | 44.58 |

| | |
|---|---|
| 6000/000/00/0016/0063/000 | 157.36 |
| 6000/000/00/0019/0015/000 | 26.03 |
| | --------- |
| **එකතුව** | **229.57** |
| | ===== |

## 2.5 විගණන නිරීක්ෂණය

ආරක්ෂක අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛනයක් පවත්වා නොතිබුණු අතර තවත් ලේඛන දෙකක් යාවත්කාලීන කර පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | පවත්වා නොතිබුණි. |
| (ii) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි |
| (iii) | දෙපාර්තමේන්තු (විසර්ජන සම්මත) වැය ලෙජරය | මුදල් රෙගුලාසි 447 | - එම - |

## 3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 8 කට 2017 ජූලි 03 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. මිලියන 1,644 ක් වී තිබුණි.

**3.3 විසර්ජන ගිණුම**

-----------------

**අයවැය විචලනය**

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 12 ක් සඳහා සලසා තිබුණු රු. මිලියන 46.7 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි

(ආ) වැය විෂයයන් 42 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 ක සිට සියයට 99 ක් දක්වා අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මුදල් රෙගුලාසි 66 හා 69 යටතේ වූ ඉල්ලුම්පත් 23 කින් රු.මිලියන 110.14 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කර ගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම මාරු කර ගත් ප්‍රතිපාදනවලින් රු.මිලියන 38.82 ක් උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

(ඈ) 2015 දෙසැම්බර් 31 දිනැති අංක 07/2015 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2 ඡේදය ප්‍රකාරව 1202 ඉන්ධන වියදම් වැය විෂය යටතේ සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 15 ක් හා 1404 ප්‍රවාහන වියදම් වැය විෂයෙන් සියයට 10 ක ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි කළ යුතුව තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසනා වන විට එම වැය විෂයයන්වලින් අදාළ ප්‍රතිපාදන ඉතිරි කිරීම් සිදු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් සඳහා ප්‍රවාහන දීමනාව වශයෙන් රු.මිලියන 5.54 ක් ගෙවා තිබුණි. නමුත් එම වියදම 1401 ප්‍රවාහන වියදම් වශයෙන් ගිණුම්ගත කළ යුතු වුවත්, එය 1003 වෙනත් දීමනා වැය විෂය යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඊ) වැය විෂයන් 03 ක වියදම් වැය ලෙජරය හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් සමඟ සැසඳීමේදී රු. මිලියන 94.49 ක වෙනස්කම් නිරීක්ෂණය විය. එම වෙනස්කම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත්, නිවැරදි කළ බවට සාක්ෂි වගණනය වෙත ලැබී නොතිබුණි.

**3.4 පොදු තැන්පත් ගිණුම**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයේ පොත් අනුව පොදු තැන්පත් ගිණුම් 2 ක ශේෂවල එකතුව හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව ශේෂ අතර රු.මිලියන 2.54 ක වෙනසක් අනාවරණය වී තිබුණි. එම වෙනස්කම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිවැරදි කිරීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන පොදු තැන්පතු ගිණුම් 4 ක ශේෂයන්හි ඇතුළත් වර්ෂ 02 ඉක්ම වූ එකතුව රු.මිලියන 12.40 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.5** **ආදායම් ගිණුම**

**----------------**

අමාත්‍යාංශ ලේකම්වරයා ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් අංක 10.03.07.05 දරන ආදායම් සංකේතය යටතේ ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවැරී තිබුණි. එම ආදායම් සංකේතවලට අදාළව සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ගිනිඅවි බලපත්‍ර අළුත්කර නොගැනීම හේතුවෙන් හිඟ බලපත්‍ර ආදායම රු.මිලියන 1.26 ක්ද, ඇතුළුව 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ආදායම රු.මිලියන 2.58 ක් වී තිබුණි. එම හිඟහිටි ආදායමෙන් රු.මිලියන 0.55 ක් වර්ෂ 3 කට වැඩි කාලයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ආදායම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ආ) ගිනි අවි සහ පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් වූ පනත්වල දක්වා ඇති නියමයන් අනුව අමාත්‍යාංශය විසින් දැනට ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරකම් 22 ක් සම්බන්ධයෙන් සම්මත කර ගන්නා ලද හෝ අනුමත කර ගත යුතු අභ්‍යන්තර කාර්ය පටිපාටි සංග්‍රහය හෝ අභ්‍යන්තර චක්‍රලේඛ සකස් කර විෂය භාර නිලධාරීන් වෙත සන්නිවේදනය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 11 දිනැති අංක PFD/04/08/01/59/පොදු දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02(i) ඡේදය ප්‍රකාරව ආර්ථික තත්ත්වයේ වෙනස්කම් සැලකිල්ලට ගනිමින් නොයෙකුත් සේවාවන් සඳහා අයකරනු ලබන ගාස්තු කාලානුරූපීව සංශෝධනය කළ යුතු වුවත්, 1996 අංක 22 දරන තුවක්කු (සංශෝධන) පනත යටතේ අයකරනු ලබන තුවක්කු බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් 2000 වර්ෂයෙන් පසු කිසිදු සංශෝධනයක් සිදුකර නොතිබුණි.

**3.6** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**------------------------------------------------------------------**

විෂය අංක 10301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට හිඟහිටි ණය ශේෂයෙන් වර්ෂ 5 කට වැඩි කාලයක සිට පැවැත එමින් තිබුණු රු.මිලියන 5.23 ක ණය ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අපොහොසත් වී තිබුණි.

**3.7** **යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**---------------------------------------**

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

**----------------------------**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා විගණකාධිපති වෙත 2016 සැප්තැම්බර් 21 දින ප්‍රමාදයක් සහිතව ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂයේ අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රධාන අංශ 03 ක වියදම් ඇස්තමේන්තු නොදැක්වීම, ඇස්තමේන්තු තාත්ත්වික ලෙස ඉදිරිපත් නොකිරීම, අරමුණු අනුව කාර්යය සැලැසුම් සකස් කර නොතිබීම හා ඉලක්ක ගත කාර්යසාධන දර්ශක සඳහන් නොකර ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි.

**3.8 වත්කම් කළමනාකරණය**

---------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) අමාත්‍යාංශය තනි ඒකකයක් සේ සලකා සියළුම ඒකකවල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය කාණ්ඩ 14 ක් ලෙස කිරීමට සැලැසුම් කර තිබුණද, කාණ්ඩ 02 ක සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වෙනත් අමාත්‍යාංශයකට අයත් නිවාසයක් විධිමත් පරිදි පවරා ගැනීමෙන් තොරව ආරක්ෂක ලේකම්ගේ නිල නිවස ලෙස භාවිතා කරමින් තිබුණි.

**3.9 බැරකම්වලට එළඹීම**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී මුදල් රෙගුලාසි 94(1) විධිවිධානයට පටහැනිව වැය විෂයයන් 07 ක් සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනය ඉක්මවා එකතුව රු.මිලියන 11.88 ක බැරකම්වලට එළඹ තිබුණි.

(ආ) පුද්ගල අනන්‍යතා ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට 2012 වර්ෂයේදී පෞද්ගලික බැංකු දෙකක් හා රාජ්‍ය බැංකු දෙකකින් ලබා ගෙන තිබුණු ඒකාබද්ධ ණය මුදලින් 2016 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 7,808.28 ක් වූ ණය ශේෂය විසර්ජන ගිණුමේ බැරකම් යටතේ සඳහන් කර නොතිබුණි.

**3.10 අනුකූල නොවීම්**

--------------------

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

----------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|
| | **රු. මිලියන** | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 104(4) | 12.31 | අලාභහානි සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා අලාභහානිය සිදු වූ දිනයේ සිට මාස 3 ක් ඇතුළතදී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද ආරක්ෂක මූලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘති ගොඩනැගිල්ලක 2014 පෙබරවාරි 15 ඇති වූ හදිසි ගින්න සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පවත්වා |

| | | |
|---|---|---|
| | | පූර්ණ වාර්තාවක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 756, 757 හා 1647 (ආ) | 2015 වර්ෂයේ සහ ඊට පෙර වර්ෂවලදී අමාත්‍යාංශය සතු වාහන සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |
| ( iii) | මුදල් රෙගුලාසි 1645(ආ), (ඇ) හා 1646 | සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය සතු සංචිත වාහන 155 කට අදාළව දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. . |
| (iv) | මුදල් රෙගුලාසි 702(3) | අකුරේගොඩ ව්‍යාපෘතිය හැර අමාත්‍යාංශය විසින් සංවර්ධන වැඩ, සැපයුම් හා සේවා සම්බන්ධයෙන් එළඹ තිබුණු ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

-----------------------------

| | |
|---|---|
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | අමාත්‍යාංශය සතු වාහන සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන දහනය සම්බන්ධයෙන් පරීක්ෂාවන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදු කර නොතිබුණි. |

**(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**

------------------------------------

| | | |
|---|---|---|
| (i) | 5.4.11 මාර්ගෝපදේශය - | බදු ඉන්වොයිස් පත් නොමැතිව භාණ්ඩ හා සේවා වෙනුවෙන් රු.මිලියන 2.19 ක් වූ එකතු කළ අගය මත බදු (VAT) පෞද්ගලික සමාගම් 03 ක් වෙත ගෙවා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | 5.4.12 මාර්ගෝපදේශය | | අර්ධ වශයෙන් නිම කළ රණවිරුවන්ගේ නිවාස නිම කරදීමේ ව්‍යාපෘතියේ මාසිකව සිදු කරනු ලබන ගෙවීම් තුළ එකතු කළ අගය මත ගෙවූ බදු පිළිබඳ විස්තර එළඹෙන මාසයේ 15 දින හෝ ඊට පෙර, දේශීය අදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත යවන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) | 8.9.1 මාර්ගෝපදේශය | 96.73 | රණවිරු අර්ධ නිවාස ඉදිකිරීම් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී සැපයුම්කරුවන් 08 දෙනෙකුගෙන් වටිනාකම රු. මිලියන 96.73 ක් වූ මිලදී ගැනීම් සඳහා ලිඛිත ගිවිසුම්වලට එළඹ නොතිබුණි. |
| (iv) | 4.2.2 හා 4.2.3 වගන්ති | 1,128.12 | අමාත්‍යාංශ ප්‍රසම්පාදන කටයුතුවලට අදාළව ප්‍රසම්පාදන කාර්යයන් සඳහා කාල සටහන පිළියෙල කර නොතිබුණි. |

**3.11 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**3.11.1** ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අකුරේගොඩ ආරක්ෂක මූලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතිය**

අකුරේගොඩ ආරක්ෂක මූලස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) 2012 වර්ෂයේදී රු.බිලියන 25 ක් ලෙස මුල් ඇස්තමේන්තුව අනුව ආරම්භ කර තිබුණු මෙම ව්‍යාපෘතියේ විෂය පථය හා ඇස්තමේන්තු සංශෝධනය කිරීම හේතුවෙන් එය රු. බිලියන 53.29 ක් වශයෙන් ඇස්තමේන්තුගත වටිනාකම වැඩි වී තිබුණි. මෙම පිරිවැය ඇස්තමේන්තු සංශෝධනය සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය 2016 ඔක්තෝබර් 04 දින ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතිය සඳහා සලසන ලද රු.මිලියන 5,546.27 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2,893.65 ක් හෙවත් සියයට 52 ක ප්‍රමාණයක් පමණක් උපයෝජනය කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත්කරුවන් 05 දෙනෙකු විසින් ඉදිරිපත් කර තිබුණු කාලය දීර්ඝ කිරීමේ හිමිකම් පෑම් 09 ක් වෙනුවෙන් රු.මිලියන 222.88 ක් වූ අතිරේක වගකීමකට එළඹ තිබුණි.

(ii) ව්‍යාපෘතියේ ආරම්භ කර තිබුණු ප්‍රසම්පාදන කාර්යයන් 21 ක් සම්බන්ධයෙන් දින 244 සිට දින 1081 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදවීම් පැවති අතර ඉදිකිරීම් ද්‍රව්‍ය සපයා ගැනීමේ දුෂ්කරතා සහ අමාත්‍යාංශ අනුමැතීන් ලබාදීමේ ප්‍රමාදයන් මත සමස්ත ව්‍යාපෘතියේ ඉදිකිරීම්වල ප්‍රමාදයක් පැවැති බව නිරීක්ෂණය විය.

**(ආ) පුද්ගල අනන්‍යතා ලේකම් කාර්යාල ගොඩනැගිලි ව්‍යාපෘතිය**

**------------------------------------------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) උක්ත ව්‍යාපෘතිය සඳහා වාණිජ බැංකු 03 කින් රු.මිලියන 7,550 ක ණයක් ලබා ගෙන තිබුණි. අදාළ ණය ආපසු ගෙවීම් 2015 අගෝස්තු 01 දිනෙන් ආරම්භ වී තිබුණු අතර ඊට අමතරව තවත් රු.මිලියන 337.71 ක ණයක් ලබාගෙන තිබුණි. ඒ අනුව අර්ධ වාර්ෂිකව ගෙවිය යුතු ණය වාරිකය රු.මිලියන 267.61 ක සිට රු.මිලියන 278.87 ක් දක්වා ණය වාරිකය රු.මිලියන 11.26 වැඩි වී තිබුණු අතර මාසික පොලී ප්‍රතිශතය සියයට 8.00 ක සිට සියයට 13.12 ක් දක්වා පරාසයකින් වැඩි වී තිබුණි.

(ii) දේශීය ණය ගැනීම්වලට අදාළව රු. මිලියන 863.06 ක් පොලී වශයෙන් ගෙවා තිබුණු අතර එය 1601 වැය විෂය යටතේ ගිණුම්ගත කර නොතිබුණි. එසේම ණය වාරික ගෙවීම් ලෙස ගෙවා තිබුණු රු. මිලියන 557.73 ක් 3001 වැය විෂය යටතේ ගිණුම්ගත කරද නොතිබුණි. එම ණය වාරික හා පොලිය 2502 වැය විෂය යටතේ ගිණුම්ගත කර තිබුණි.

(iii) ගොඩනැගිල්ලේ අයිතිය වෙනත් ආයතනවලට පැවරීම හා කුලී මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් පත්කර තිබුණු නිලධාරී කමිටුව විසින් ගණනය කළ නිර්මාණ පිරිවැය, ඉදිකිරීම් පිරිවැය, වර්ෂ 30 ක් දක්වා කාලයක් තුළ ගෙවිය යුතු ණය පොලිය, ප්‍රාග්ධනිත පිරිවැය හා නවීකරණ පිරිවැය නඩත්තු ගිවිසුම හා නඩත්තු කාර්ය මණ්ඩල පිරිවැය සහ වර්ෂ 50 ක් දක්වා අවශ්‍ය මෙවලම් හා උපකරණ පිරිවැය හා ඉඩම් පිරිවැය ඇතුළු රු.මිලියන 29,118 ක සමස්ථ පිරිවැය හඳුනාගෙන තිබුණි. ඒ අනුව වර්ග අඩියක් සඳහා පදනම් 04 යටතේ වර්ගීකරණය කර ගාස්තු සලකා බැලීමෙන් පසු කාර්ය මණ්ඩල පිරිවැය රහිතව නඩත්තු වියදම වූ රු. මිලියන 11,597.31 ක පදනම් කරගෙන වර්ග අඩියක් සඳහා රු.37.65 ක් ලෙස පිරිවැය ගණනය කර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2016 නොවැම්බර් 24 දින වන විටත් දැනට ගොඩනැගිල්ලේ ස්ථාපිත ආයතන 05 ක් අතරින් කිසිදු ආයතනයක් සමඟ ගිවිසුම් අත්සන් කර නොතිබුණි. ගොඩනැගිල්ල කුලී පදනම මත ලබාගෙන තිබුණු කිසිඳු ආයතනයක් විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කුලී මුදල් ගෙවා නොතිබුණු බව නිරීක්ෂණය විය.

(iv) 2016 අගොස්තු 25 යුධ හමුදාවේ නඩත්තු ඒකකය විසින් හඳුනා ගෙන තිබුණු ඉදිකිරීම් අඩුපාඩු 26 ක්, විදුලි පද්ධති පිළිබඳ අඩුපාඩු 17 ක් හා සංඥා උපකරණ පිළිබඳ ගැටළු 05 ක් සම්බන්ධව කොන්ත්‍රාත්කරුට සහ උපදේශක සමාගම වෙත දැනුම් දී විධිමත්ව නිම කරවා ගැනීම හෝ අදාළ රඳවුම් මුදලින් අය කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) **උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය**

---------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 1,192 ක් වී තිබුණත්, පසුව එය රු.මිලියන 1,297.25 ක් දක්වා සංශෝධන කර තිබුණි. ඒ සඳහා අදාළ පාර්ශ්වයන්ගෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.මිලියන 590.00 ක ශුද්ධ ප්‍රතිපාදනයක් සලසා තිබුණත්, සමාලෝචිත වර්ෂයේදී ඉන් රු.මිලියන 20.32 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 3.44 ක් උපයෝජනය කර තිබුණි.

(iii) 2016 මැයි 25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2016 වර්ෂයේ සිට ශුන්‍ය පාදක අයවැය ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ලබන බවත්, ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා වෙන්කරනු ලැබ ඇති අරමුදල් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා වර්ෂය තුළදීම නිසිලෙස උපයෝගී කර ගන්නා ලෙස දක්වා තිබුණද, ව්‍යාපෘතියේ මූල්‍ය කාර්යසාධනය හා භෞතික කාර්යසාධනය දුර්වල මට්ටමක පැවතිණි.

(iv) ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන සැලැස්මේ රු.මිලියන 1,128.12 ක් ප්‍රසම්පාදන කාර්යයන් සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 හා 4.2.3 මාර්ගෝපදේශවලට අනුව කාලසටහන පිළියෙල කර නොතිබුණි.

(v) 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මධ්‍යකාලීන වියදම් රාමුවක් තුළ ව්‍යාපෘතියේ සැලසුම් කළ කාර්ය නිම කිරීමට අපේක්ෂා කර තිබුණද සන්නිවේදන කුළුණු ස්ථාපිත කිරීමට නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබාගැනීම ප්‍රමාද වීම, භූමි පරීක්ෂණ කටයුතු ප්‍රමාදවීමත් හේතුවෙන් සන්නිවේදන කුළුණු ඉදිකිරීමේ ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වී තිබුණි. ඒ හේතුවෙන් මයික්‍රො තරංග ගුවන් විදුලි සන්නිවේදන පද්ධති මිලදී ගැනීමේ කටයුතුද ප්‍රමාද වී තිබුණි.

(vi) ව්‍යාපෘතියේ එක් එක් ක්‍රියාකාරකම් සඳහා නිශ්චිත කාල රාමුවක් සකසා ප්‍රමුඛතා පදනමක් මත අනුපිළිවෙලට පිළියෙල කරන ලද ක්‍රියාකාරකම් අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු වුවත්, ඒ පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි. එකතු කළ අගය මත බදු රහිත වටිනාකම රු.මිලියන 34.22 ජෙනරේටර් 22 කින් 12 ක් සමාලෝචිත වර්ෂයේ අවසාන වන විටත් නියමිත ස්ථානවල ස්ථානගත කර නොතිබුණි.

3.11.2 **නව ව්‍යාපෘති යෝජනා සඳහා ප්‍රතිපාදන සලසා ගැනීම**

---------------------------------------------------------

අමාත්‍යාංශය යටතේ වූ ආයතනවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වූ 103-01-02-09-2502 වැය විෂය යටතේ නව ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් රෙගුලාසි 66 හා 69 මාරු කිරීම මගින් රු.මිලියන 450.00 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. මේ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 244 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

### 3.11.3 අනුමත ව්‍යාපෘති ප්‍රතිපාදන ඉවත් කර නව ව්‍යාපෘති ආරම්භ කිරීම

---

ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර ප්‍රදාන වශයෙන් වූ මෙරිටයිම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2015 වර්ෂයේ සිට හඳුනා ගෙන සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 8.50 ක ප්‍රතිපාදනය සලසා ගෙන තිබුණි. කෙසේ වෙතත් මෙරිටයිම් ආරක්ෂක ධාරිතා වැඩි දියුණු කිරීම් ව්‍යාපෘතිය නම් වූ වෙනත් ව්‍යාපෘතියකට මෙම ප්‍රතිපාදන අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ දී මාරු කර ගෙන තිබුණි.

### 3.12 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් කර නොතිබුණු මාස 6 කට වැඩි කල් ගත වී තිබුණු එකතුව රු.136,723 ක් වටිනා චෙක්පත් 09 සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම් 02 ක් පරීක්ෂාවේදී 2017 පෙබරවාරි 28 දිනට පිළියෙල කර තිබුණු බැංකු සැසඳුමෙහි 2016 දෙසැම්බර් 31 දිනට අදාළව හඳුනා නොගත් ගෙවීම් අවස්ථා 23 ක් යටතේ රු. මිලියන 246.71 ක් හා හඳුනා නොගත් ලැබීම් අවස්ථා 19 ක් යටතේ රු. මිලියන 0.41 ක් 2017 පෙබරවාරි 28 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 3.13 අධිකාරී බලය නොලත් ගනුදෙනු

---

සමාලෝචිත වර්ෂයේදී රණවිරු අර්ධ නිවාස සම්පූර්ණ කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 194.80 ක ශුද්ධ ප්‍රතිපාදනයක් සලසා තිබුණි. වැය ලෙජරයේ කර තිබුණු සටහන් අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 201.09 ක් වැය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනය රු.මිලියන 6.29 කින් ඉක්මවා අධිවැයක් ඇති වී තිබුණි. එම අධිවැය වැලැක්වීම සඳහා එම වැය විෂය යටතේ සටහන් වූ තිබුණු රු.මිලියන 6.39 ක වියදම් වෙනත් වැය විෂයකට මාරු කර තිබුණි. එම මාරු කිරීමේ සටහන සඳහා විධිමත් පරිදි අධිකාර බලයක් ලබා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 3.14 කළමනාකරණ දුර්වලතා

---

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) අමාත්‍යාංශයට අයත් වාහන සම්බන්ධයන් පවත්වාගෙන යනු ලබන ලේඛනයේ 2015 දෙසැම්බර් 31 දිනට හා 2016 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කළ වාහන ලැයිස්තුව අනුව ජාතික ශිෂ්‍ය භට බලකාය යටතේ ඇතුළත් විය යුතු වාහන 09 ක් එම ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

(ආ) ත්‍රිවිධ හමුදාව හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය දේපල භාවිතා කරමින් බාහිර පාර්ශවයන් වෙත විවිධ සේවා සැපයීමෙන් උපයනු ලබන විවිධ ආදායම් රජයේ නොවන සුභසාධන අරමුදල් වලට "බැර" කර තිබුණි. මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී

විගණනය වෙත ලැබී තිබුණු තොරතුරු අනුව ව්‍යාපෘති 16 ක් වෙනුවෙන් රු.මිලියන 2,549.74 ක් අරමුදලට බැර කර තිබුණි. නමුත් එසේ පවත්වාගෙන යන අරමුදල් පිළිබඳ සම්පූර්ණ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද මේ සම්බන්ධව ආරක්ෂක අමාත්‍යශයේ ලේකම්වරයා විසින් ත්‍රිවිධ හමුදාපතිවරුන් හා අනෙකුත් ආයතනවල ප්‍රධානින් සමග සිදු කර තිබුණු සාකච්ඡාවලදී හා විගණන හා කළමණාකරන කමිටුවේ රැස්වීම්වලදී සියළුම ආයතනවල අරමුදල් උපයෝජනය හා රැස්කරනු ලබන ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සම්බන්ධව විධිමත් ක්‍රමවේදයන් සකසා ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණද, එම කාර්යයන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉටු කර නොතිබුණි.

## 3.15 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 51 | 43 | 08 |
| (ii) | තෘතියික මට්ටම | 10 | 06 | 04 |
| (iii) | ද්විතියික මට්ටම | 230 | 148 | 82 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 136 | 115 | 21 |
| | **එකතුව** | **427** | **312** | **115** |

### (ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව සන්නද්ධ හමුදාවල නිලධාරීන් 53 දෙනෙකුද, සෙසු නිල සාමාජිකයන් 266 දෙනෙකුද අමාත්‍යාංශයේ රාජකාරි සඳහා අනුයුක්ත කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ අධිකාරියකට අයත් සේවකයන් 08 දෙනෙකු, ආරක්ෂක අධීක්ෂකවරයකු හා ආරක්ෂක නියාමකවරු 07 දෙනෙකු ලෙස ආරක්ෂක අමාත්‍යාංශයේ රාජකාරි සඳහා යොදවා ගෙන තිබුණි.